බස්නාහිර පළාතේ ආණ්ඩුකාර ලේකම් කාර්යාලය

மேல் மாகாண ஆளுநர் பணிமனை

**SECRETARIAT OF THE GOVERNOR - WESTERN PROVINCE**

" ජනතා හිතවාදී විශිෂ්ඨතම පළාත් රාජ්‍ය සේවාවක් "


| | | |
|---|---|---|
| ඔබේ අංකය. / உமது இல. / Your Ref. 1/4/2/5/131 | මගේ අංකය / எனது இல. / My Ref. GOS/ADM/4/7/286 | දිනය / திகதி / Date 2016.10.03 |

04 OCT 2016

ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
109, මහ විදිය
බත්තරමුල්ල,

<u>බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ ප්‍රජා සංවර්ධන නිලධාරී තනතුර සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය</u>

උක්ත මැයෙන් යුතු ඔබේ සමාංක හා 2016.09.14 දිනැති ලිපිය හා බැඳේ.

ඒ අනුව බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ ප්‍රජා සංවර්ධන නිලධාරී තනතුර සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය 2016.09.28 දාතමින් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කර ඇති බව කාරුණිකව දන්වමි.

අනුමත කරන ලද අදාළ පරිපාටියේ පිටපතක් මේ සමග ඔබ වෙත එවමි.

**අ.කළේ/පී.සෝමසිරි**
බ.ප .ආණ්ඩුකාර ලේකම්

ජේ.සී.ජයලාල්
පරිපාලන නිලධාරි

පිටපත් : 1. ප්‍රධාන ලේකම්, ප්‍රධාන ලේකම් කාර්යාලය (බ.ප) — අනුමත කරන ලද යථෝක්ත පරිපාටියේ පිටපත් 02 ක් මේ සමග ඔබවෙත එවමි.


| ලිපිනය / முகவரி Address | 109,. 5 වන මහල, රොටුන්ඩා ගොඩනැගිල්ල, ගාලු පාර, කොළඹ 03.<br>109, 5ம் மாடி, றொட்டுண்டா கோபுரம், காலி வீதி, கொழும்பு - 03<br>109, 5th Floor, Rotunda Tower, Galle Road, Colombo 03 | | | |
|---|---|---|---|---|
| | ආණ්ඩුකාර ලේකම් /ஆளுநரின் செயலாளர் Secretary to the Governor | සහකාර ලේකම් / உதவிச் செயலாளர் / Assistant Secretary | පරිපාලන නිලධාරී / நிர்வாக அதிகாரி / Administartive Officer | කාර්යාලය / அலுவலகம் / Office |
| දුරකථන / தொலைபேசி / Telephone | 0112334097 | 0112334737 | 011 3159587 | 0112334347 / 0112334348 |
| ෆැක්ස් / பெக்ஸ் / Fax | 0112334098 | 0112334738 | | |
| විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / E-mail | secretary@governor.wp.gov.lk | as@governor.wp.gov.lk | ao@governor.wp.gov.lk | cma@governor.wp.gov.lk<br>info@govsec.wpc.gov.lk |

## <u>බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ</u>
## <u>ජ්‍යෙෂ්ඨ ප්‍රජා සංවර්ධන නිලධාරී තනතුර සඳහා වන</u>
## <u>බඳවා ගැනීමේ පරිපාටිය.</u>

**1. සම්බන්ධ වන ආයතන**

| | | |
|---|---|---|
| 1.1 දෙපාර්තමේන්තුව | :- | පළාත් පාලන දෙපාර්තමේන්තුව(බ.ප) |
| | | යොමු අංකය :- එල්ජීඩී/02/21/03/125 |
| | | දිනය :- 2016.07.29 |
| 1.2 අමාත්‍යාංශය | :- | පළාත් පාලන අමාත්‍යාංශය (බ.ප) |
| | | යොමු අංකය :- සීඑම්/ඩබ්පී/ර්15/5/1-6 |
| | | දිනය :- 2016.08.05 |
| 1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුර අනුමත කිරිම | :- | යොමු අංකය :- ඩීඑම්එස්/ඩී/පොදු/11-2 |
| | | දිනය :- 2012.12.19 |
| 1.4 ප්‍රධාන ලේකම්(බ.ප) නිර්දේශය | :- | යොමු අංකය :- CSO/PTR/15/3/24 |
| | | දිනය :- 2016-08-22 |
| 1.5 වැටුප් කොමිෂන් සභාවේ නිර්දේශය | :- | යොමු අංකය :- |
| | | දිනය :- |
| 1.6 බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය :- | | යොමු අංකය :- 1/4/2/5/[illegible] |
| | | දිනය :- 2016.09.14 |
| 1.7 ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය | :- | යොමු අංකය :- |
| | | දිනය :- |

**2. පත් කිරීම් බලධාරියා** :- බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව.
ක්‍රියාත්මක වන දිනය :- ගරු ආණ්ඩුකාරතුමා අනුමත කළ දින සිට ක්‍රියාත්මක වේ.

අනුමත කරමි / ~~නොකරමි~~
දිනය 28/9/16
කේ.සී. ලෝගේස්වරන්
ආණ්ඩුකාරවර
බස්නාහිර පළාත

**3. සේවා ගණය පිළිබඳ විස්තර**

3.1 සේවා ගණය :- අධීක්ෂණ.

3.2 ශ්‍රේණි :- විශේෂ ශ්‍රේණිය.

3.3 පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය :-

අනුමත තනතුරු සංඛ්‍යාවට සීමා වන පරිදි අභ්‍යන්තර බඳවා ගැනීමේ ක්‍රියාවලියක් මගින් බඳවා ගනු ලබන, ජ්‍යෙෂ්ඨ විධායක හා විධායක නිලධාරීන්ගේ කාර්යභාරයට පරිපූරක/ සුසාධ්‍යකාරක/උපස්ථම්භක වන පරිදි එම නිලධාරීන්ගේ අධීක්ෂණයට යටත් ව තනතුරට විශේෂිත කොට පවරා දෙනු ලබන පරිපාලනමය/ පිරිස් කළමනාකරණ කාර්යයන් පැවරෙන නිලධර ගණයකි.

3.4 කාර්යයන් පැවරීම :-

පළාත් පාලන කොමසාරිස්ගේ උපදෙස් මත පළාත් පාලන සහකාර කොමසාරිස් විසින් සිදු කරනු ලබයි.

**4. තනතුරෙහි ස්වභාවය** :- ස්ථිර, විශ්‍රාම වැටුප් සහිතය.

**5. වැටුප්**

5.1 වැටුප් කේත අංකය :- MN 7- 2016 (රා.ප.ච.03/2016 අනුව)

5.2 වැටුප් පරිමාණය :- 41,580 - 11 x 755 - 18 x 1030 – 68,425/-

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර :-

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු.) |
|---|---|---|
| විශේෂ | පියවර 01 | 41,580/- |

සටහන:

බඳවා ගැනීම්වල දී නිකුත් කරනු ලබන පත්වීම් ලිපිවල වැටුප් පරිමාණය සඳහන් කිරීමේදී අංක 3/2016 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I හි සඳහන් නියමිත වැටුප් පරිමාණය සඳහන් කළ යුතුය. එහෙත් ගෙවීම් සිදු කළ යුත්තේ, උපලේඛන II හි සඳහන් පරිදි බැව් පත්වීම් ලිපියේ සඳහන් කළ යුතුය.

## 6. සේවා ගණයට අයත් තනතුර/තනතුරු :-

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :-

| අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ ප්‍රජා සංවර්ධන නිලධාරි | විශේෂ | 03 | • පළාත් පාලන ආයතනවලට අනුයුක්ත කර ඇති ප්‍රජා සංවර්ධන නිලධාරීයන්ගේ රාජකාරි කටයුතු අධීක්ෂණය හා පළාත් පාලන කොමසාරිස්, පළාත් පාලන සහකාර කොමසාරිස්, සහකාර කොමසාරිස් (ප්‍රජා සංවර්ධන) වෙතින් ලැබෙන උපදෙස් නියෝග අනුව ප්‍රජා සංවර්ධන නිලධාරීන් දැනුවත් කිරීම.<br>• පළාත් පාලන ආයතන බල ප්‍රදේශ තුළ ප්‍රජා මණ්ඩල ඇති කිරීම හා ක්‍රියාකාරීව පවත්වාගෙන යාම සඳහා පළාත් පාලන ආයතනයන්ට අනුයුක්ත කර ඇති ප්‍රජා සංවර්ධන නිලධාරීන් කටයුතු කරන බවට වගබලා ගැනීම.<br>• ඒ තුළින් ප්‍රජාව දිරිගැන්වීමට කටයුතු කිරීම, පළාත් පාලන ආයතනයේ කටයුතු සඳහා ප්‍රජා සහභාගීත්වය ලබා ගැනීමට කටයුතු කරන බවට අධීක්ෂණය හා උපදෙස් ලබා දීම.<br>• පළාත් පාලන ආයතනය යටතේ ක්‍රියාත්මක වන පුස්තකාල, පෙර පාසල්, ආයුර්වේද බෙහෙත් ශාලා, සායන , ප්‍රජා සංවර්ධන නිලධාරීන්ගේ උපදෙස් හා මග පෙන්වීම යටතේ විධිමත්ව ක්‍රියාත්මක වන බවට අධීක්ෂණය.<br>• කසල කළමනාකරණය හා පරිසර සංරක්ෂණය කිරීම සඳහා ඒ ඒ පළාත් පාලන ආයතන මට්ටමෙන් විධිමත් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන බවට අධීක්ෂණය හා මග පෙන්වීම.<br>• පළාත් පාලන ආයතන මට්ටමින් සාහිත්‍ය උත්සව සංවිධානය කරන බවට අධීක්ෂණය කිරීම හා දිස්ත්‍රික් සාහිත්‍ය උත්සවය සංවිධානය කිරීම.<br>• ප්‍රජා සංවර්ධන විෂය ක්ෂේත්‍රයට අදාළව ලැබෙන පෙත්සම් පැමිණිලි ලිපි සම්බන්ධයෙන් අදාළ ප්‍රජා සංවර්ධන නිලධාරීන් මගින් පරීක්ෂා කරවා එකී වාර්තා නිරීක්ෂණ හා නිර්දේශය සහිත ව පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත ඉදිරිපත් කිරීම |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව :- 03යි.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය :....G-5/ASK/4/2/L-46.... දිනය :....16/9/18

## 7. බඳවා ගැනීමේ ක්‍රමය :-

7.1 බඳවා ගන්නා ප්‍රතිශතයන් :-

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | - |
| සීමිත | 100% |
| කුසලතා | - |

7.2 විවෘත බඳවා ගැනීම :- අදාළ නැත.

7.3 සීමිත බඳවා ගැනීම

7.3.1 බඳවා ගන්නා ශ්‍රේණිය :- විශේෂ ශ්‍රේණිය.

7.3.2 සුදුසුකම්

7.3.2.1 අධ්‍යාපන සුදුසුකම් :- අදාළ නැත.

7.3.2.2 වෘත්තීය සුදුසුකම් :- අදාළ නැත.

7.3.2.3 පළපුරුද්ද :- I ශ්‍රේණියේ ප්‍රජා සංවර්ධන නිලධාරියෙකු වශයෙන් වසර 05 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

සහ

I ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී තිබීම

7.3.2.4 කායික සුදුසුකම් :- තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

7.3.2.5 වෙනත් :-

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වීම.
ii. යහපත් චරිතයකින් යුක්ත වීම.
iii. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබීම.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී. දිනය :... 24/6/21
ගොනු අංකය :... GOS/ADM/4/7/286

7.3.3 වයස

7.3.3.1 අවම සීමාව :-
7.3.3.2 උපරිම සීමාව :-

දැනට සේවයේ නියුතු I ශ්‍රේණියේ ප්‍රජා සංවර්ධන නිලධාරීන්ගෙන් බඳවා ගන්නා බැවින් වයස් සීමාව අදාළ නොවේ.

7.3.4 බඳවා ගැනීමේ ක්‍රමය

7.3.4.1 ලිඛිත විභාගය

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| පළාත් මූල්‍ය රීති හා පළාත් පාලන ආයතනවල මූලික අණපනත් හා ආනුෂංගික නීති. | 100 | 40% |
| ආයතන කාර්යය පරිපාටිය | 100 | 40% |
| සිද්ධි අධ්‍යයනය | 100 | 40% |

(ලිඛිත විභාගයේ විෂය නිර්දේශය - ඇමුණුම අංක 01)

7.3.4.1.1. පවත්වන බලධරයා :- බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ ඔවුන් විසින් බලය පවරනු ලබන ආයතනයක් මගින්.

සටහන :-

- ලිඛිත විභාගයෙන් සමත් අපේක්ෂකයින් විසින් ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව ඉහළ ම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයින් පවත්නා පුරප්පාඩු සඳහා තෝරා ගනු ලැබේ.
- පුරප්පාඩු සංඛ්‍යාවට සමාන හෝ අඩු අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඉදිරිපත් වී සිටින අවස්ථාවක දී විභාගයක් නොපවත්වා සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

7.3.4.2 වෘත්තීය පරීක්ෂණය :- අදාළ නැත.

7.3.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :-

ඉටු කර ගැනීමට අපේක්ෂිත අරමුණු :- ලකුණු ලබා දෙනු නොලැබේ. සුදුසුකම් පරික්ෂා කිරීම සඳහා පමණක් පවත්වනු ලැබේ.

7.3.4.4 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :- අදාළ නැත.

7.3.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය :- අභ්‍යන්තර නිවේදනයක් මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

7.4 කුසලතා පදනම මත බඳවා ගැනීම :- අදාළ නැත.

**8. කාර්යක්ෂමතා කඩඉම :- අදාළ නැත.**

**9. භාෂා ප්‍රවීණතාවය :-**

9.1

| භාෂාව | ලබාගත යුතු ප්‍රවීණතාවය |
|---|---|
| 1. රාජ්‍ය භාෂාව | අදාළ නැත. |
| 2. අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට ආනුශාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය. |
| 3. සන්ධාන භාෂාව | අදාළ නැත. |

**10. ශ්‍රේණි උසස් කිරීම :- අදාළ නැත.**

**11. තනතුරුවලට පත් කිරීම :- අදාළ නැත.**

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : G03/ADM/4/7/2-86 දිනය :

**12. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ දැක්වෙන පොදු කොන්දේසිවලට පරිබාහිර වන්නා වූ කොන්දේසි :-**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද, බස්නාහිර පළාත් සභා මූල්‍ය රීති සංග්‍රහයට ද, කලින් කල බස්නාහිර පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා විසින් පනවනු ලබන රෙගුලාසි නොහොත් නියෝගවලට ද, බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කල පනවනු ලබන රෙගුලාසි නොහොත් නියෝගවලට ද, අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තු නියෝගවලට ද ආයතන ප්‍රධානියා විසින් නිකුත් කරනු ලබන නියෝගවලට ද අනුව කටයුතු කළ යුතුය.

**13. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ :-**

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ කිසිවක් වෙතොත් ඒ සම්බන්ධයෙන් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව / බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විමසා කටයුතු කරනු ඇත.

**14. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය :- අදාළ නැත**

15. මෙම පරිපාටියේ විධිවිධාන සලසා ඇති කරුණු සම්බන්ධ ගැටළු පැන නගින අවස්ථාවක දී හා / හෝ මෙම පරිපාටියේ විධිවිධාන සලසා නොමැති කරුණු සම්බන්ධයෙන් බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විමසා තීරණය කරනු ඇත.

16. අර්ථ නිරූපණ :-

<u>සතුටුදායක සේවා කාලය:</u>

(i) පළාත් සභා රාජ්‍ය සේවයේ නිලධාරියෙකු විසින් කාර්යක්ෂමව හා අනලස්ව රාජකාරි ඉටු කිරීම මගින් ද, සමත් විය යුතුව තිබූ කාර්යක්ෂමතා කඩඉම් සමත්වීම මගින් ද, සිදු කළ යුතුව තිබූ පත්වීම් ස්ථිර කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීම මගින් ද, එම කාලය තුළ දී උපයාගත යුතුව තිබූ සියලුම වැටුප් වර්ධක උපයාගෙන ඇත්තා වූ සහ ඔහු විසින් දඬුවම් ලැබිය යුතු වරදක් සිදු නොකරන ලද්දා වූ කාලසීමාවක් වන්නේය.

(ii) නිලධාරියා වෙත ලබා දිය යුතුව තිබූ වාර්ෂික වැටුප් වර්ධක නීත්‍යානුකූල හේතු මත අත්හිටුවා ,අඩු කොට, නතර කොට හෝ විලම්භනය කොට ඇති කාල පරිච්ඡේදයක් වේ නම් එය ද, ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ, වැරදි පිළිබඳ පළමු වැනි උපලේඛනය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදු කර ඇති විටක එම වරද සිදු කරනු ලැබූ දින සිට වසර 03 ක කාලයක් ද සහ ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ, වැරදි පිළිබඳ දෙවන උපලේඛනය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදු කර ඇති විටක එම වරද සිදු කරනු ලැබූ දින සිට එක් වසරක කාලයක් ද සතුටුදායක සේවා කාලය ගණනය කිරීමේදී බැහැර කළ යුතු වන්නේය.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී දිනය : 2016/9/28
ගොනු අංකය : WPS/ADM/7/7/296

<u>සක්‍රීය සේවා කාලය:</u>

'සක්‍රීය සේවා කාලය' යනු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියලුම වැටුප් රහිත නිවාඩු කාලපරිච්ඡේදයන් සක්‍රීය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

| | | | |
|---|---|---|---|
| සකස් කළේ | : [signature] | පරීක්ෂා කළේ | : [signature] |
| නම | : ඒ.කේ.පී.එම්. මෛත්‍රීරත්න | නම | : සසිකා ලියනගේ |
| තනතුර | : පරිපාලන නිලධාරිණී, පළාත් පාලන දෙපාර්තමේන්තුව (බ.ප.) | තනතුර | : නියෝජ්‍ය කොමසාරිස් (වැ. බ) පළාත් පාලන දෙපාර්තමේන්තුව බස්නාහිර පළාත |
| දිනය | : 2016.07.27 | දිනය | : 2016.07.28 |

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : [signature]
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : චන්ද්‍රානි සමරකෝන්
තනතුර : පළාත් පාලන කොමසාරිස්
දිනය : බස්නාහිර පළාත
2016.07.29

---

යොමු අංකය : සීඑම්/ඩබ්පී/ඊ15/5/1-6

බස්නාහිර පළාතේ පළාත් පාලන දෙපාර්තමේන්තුවෙහි ජ්‍යෙෂ්ඨ ප්‍රජා සංවර්ධන නිලධාරි තනතුර සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන : ..............................

ලේකම්

පළාත් පාලන අමාත්‍යංශ (බ.ප)

එම්. ඒ. බී. දයා සේනාරත්
ලේකම්
පළාත් පාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල
පරිසර කටයුතු, ජලසම්පාදන සහ
සංචාරක කටයුතු අමාත්‍යාංශය (බ.ප.)
"ශ්‍රාවස්ති මන්දිරය", තැ.පෙ. 511
32, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ - 07.

දිනය : 2016 . 08 . 07

නිල මුද්‍රාව:

---

යොමු අංකය : CSO/PTR/15/3/24

බස්නාහිර පළාතේ පළාත් පාලන දෙපාර්තමේන්තුවෙහි ජ්‍යෙෂ්ඨ ප්‍රජා සංවර්ධන නිලධාරි තනතුර සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන : ..............................

ප්‍රධාන ලේකම්(බ.ප)

දිනය : 2016-08-22

නිල මුද්‍රාව:

ජේ. එම්. සී. ජයන්ති විජේතුංග
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

---

යොමු අංකය : 1/4/2/5/131

බස්නාහිර පළාතේ පළාත් පාලන දෙපාර්තමේන්තුවෙහි ජ්‍යෙෂ්ඨ ප්‍රජා සංවර්ධන නිලධාරි තනතුර සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී
යොමු අංකය : GOS/ADM/4/7/286 දිනය : ..............

අත්සන : ..............................

ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව(බ.ප)

දිනය : 2016-09-14

නිල මුද්‍රාව:

ඩී. රාජපක්ෂ
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
බස්නාහිර පළාත

---

යොමු අංකය : GOS/ADM/4/7/286

බස්නාහිර පළාතේ පළාත් පාලන දෙපාර්තමේන්තුවෙහි ජ්‍යෙෂ්ඨ ප්‍රජා සංවර්ධන නිලධාරි තනතුර සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය 2016 . 09 . 28 දින ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදි.

අත්සන : ..............................

ආණ්ඩුකාර ලේකම්(බ.ප)

දිනය : 2016 . 09 . 28

නිල මුද්‍රාව:

ස. සෝමසිරි
ආණ්ඩුකාර ලේකම්
බ.ප. ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
05වන මහල, රොටුන්ඩා ගොඩනැගිල්ල,
අංක: 109, ගාලු පාර, කොළඹ 03.

ඇමුණුම 01.

## <u>බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ</u>
## <u>ජ්‍යෙෂ්ඨ ප්‍රජා සංවර්ධන නිලධාරී තනතුරට බඳවා ගැනීම සඳහා වන ලිඛිත විභාගය</u>

1. විභාගයේ නම :- බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ ප්‍රජා සංවර්ධන නිලධාරී තනතුරට බඳවා ගැනීම සඳහා වන ලිඛිත විභාගය

2. විභාගය පිළිබඳ විස්තර :-

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | අවම සමත් ලකුණු |
|---|---|---|---|
| පළාත් මූල්‍ය රීති හා පළාත් පාලන ආයතනවල මූලික අණපනත් හා ආනුශාංගික නීති. | පැය 02 | 100 | 40 % |
| ආයතන කාර්යය පරිපාටිය | පැය 02 | 100 | 40 % |
| සිද්ධි අධ්‍යයනය | පැය 02 | 100 | 40 % |

3. පවත්වනු ලබන බලධරයා :- බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ බලය පවරනු ලබන ආයතනයක් මගින්

4. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග :- ඇතිවන පුරප්පාඩු සංඛ්‍යාව සලකා බැලීමෙන් පසුව.

5. විභාගය සඳහා වන විෂය නිර්දේශය:

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| පළාත් මූල්‍ය රීති හා පළාත් පාලන ආයතනවල මූලික අණපනත් හා ආනුෂංගික නීති. | • පළාත් මූල්‍ය රීති.<br>I ,II,V,VI,VII යන පරිච්ඡේද<br>• පළාත් පාලන ආයතන වලට සම්බන්ධ අණපනත් පිළිබඳ අවබෝධය විමසා බැලීම.<br>• ප්‍රාදේශීය සභා පනත, නගර සභා ආඥා පනත, මහා නගර සභා ආඥා පනත, පළාත් පාලන ආයතන සම්බන්ධව ආනුෂංගයෙන් සම්මත අතුරු ව්‍යවස්ථාව. |
| ආයතන කාර්යය පරිපාටිය | • බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කාර්ය පටිපාටික රීති හා<br>• ආයතන සංග්‍රහයේ VIII, IX, XII, XXXII පරිච්ඡේද හා ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLVII, XLVIII පරිච්ඡේද පිළිබඳ දැනුම. |
| සිද්ධි අධ්‍යයනය | ප්‍රජා සංවර්ධන විෂය ක්ෂේත්‍රයට අදාළ ගැටලුවක් ආශ්‍රයෙන් ඉදිරිපත් කරන ඡේදයක් කියවා බලා ඒ ආශ්‍රයෙන් අසනු ලබන ප්‍රශ්නාවලියක් සඳහා පිළිතුරු සැපයීම. |

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : 605/ADH/4/7/266 දිනය :

අත්සන : ..........................

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : චන්ද්‍රානි සමරකෝන්

තනතුර : පළාත් පාලන කොමසාරිස් බස්නාහිර පළාත.

දිනය : 2016.07.29